# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION

සුහුරුපාය , බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 1262/2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திகதி / Date — 02/08/2024 පැය 1530

## මාධ්‍ය නිවේදනය

**පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු**

**01. 2024.08.01 වන දින පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරීන් විසින් සිදු කරන ලද නීති විරෝධී මත්පැන් වැටලීම් සම්බන්ධ වාර්තාව පහත පරිදි වේ.**

| වැටලීම් ගණන | අත්අඩංගුවට ගත් සැකකරුවන් ගණන | නීති විරෝධී මත්පැන් ප්‍රමාණය (ලීටර්) | ගෝඩා ප්‍රමාණය (ලීටර්) | වෙනත් දේපල |
|---|---|---|---|---|
| 03 | 03 | 39 | 335 | තඹ දඟර 01<br>බැරල් 02 |

වැටලීම් සිදු කර අත්අඩංගුවට ගන්නා ලද සැකකරුවන් හා දේපල අදාළ පොලිස් ස්ථානයන් වෙත ඉදිරිපත් කර ඇත.

**02. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා සංවිධානාත්මක අපරාධ මර්ධන ඒකකය.**

2024.08.01 වන දින රාත්‍රී කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා සංවිධානාත්මක අපරාධ මර්ධන ඒකකයේ නිලධාරීන් විසින් යක්කල පොලිස් වසමේ විතානගේ මාවත ආසන්න ප්‍රදේශයේ දී වැටලීමක් සිදු කර අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 15 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන යක්කල පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 28 ක් වන වැලිවේරිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.** යක්කල පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**03. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා ගෝනහේන කඳවුර.**

2024.08.01 වන දින දහවල් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා ගෝනහේන කඳවුරේ නිලධාරීන් විසින් හංවැල්ල පොලිස් වසමේ හංවැල්ල ප්‍රදේශයේ දී වැටලීමක් සිදු කර හෙරොයින් ග්‍රෑම් 13 මිලිග්‍රෑම් 320 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන හංවැල්ල පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු** 42 **ක් වන** හංවැල්ල **ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.** හංවැල්ල පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**04. ගංජා සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා කතරගම කඳවුර.**

2024.08.01 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා කතරගම කඳවුරේ නිලධාරීන් විසින් වීරවිල පොලිස් වසමේ අදල්ල ප්‍රදේශයේ දී වැටලීමක් සිදු කර ගංජා කිලෝග්‍රෑම් 02 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන වීරවිල පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු** 36 **ක්** වන වීරවිල **ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.** වීරවිල පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**05. අයිස් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා වාලච්චේන කඳවුර.**

2024.08.01 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා වාලච්චේන කඳවුරේ නිලධාරීන් විසින් වාලච්චේන පොලිස් වසමේ තියාවට්ටවන් ප්‍රදේශයේ දී වැටලීමක් සිදු කර අයිස් ග්‍රෑම් 08 මිලිග්‍රෑම් 420 ක්, මත් කරල් 63ක් හා එම ජාවාරමෙන් උපයා ගත් බවට සැක කරන මුදල් රුපියල් 333,000/= ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන වාලච්චේන පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 43 ක් වන ඔඩ්ඩමාවඩි 01 ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.** වාලච්චේන පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**